WORKED.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,614 — 1958 දෙසැම්බර් 12 වැනි සිකුරාදා — 12.12.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)

# IV වැනි කොටස—පලාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පලාත් පාලන නිවේදන ... ... | 1221 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | 1224 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 1221 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පලාත් පාලන සහා ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | 1226 |


## පලාත් පාලන නිවේදන

### 1958වේ අංක 61 දරණ පලාත් ආණ්ඩු සහා ආඥාපනත

පී. කේ. දිසානායක මහතා, 1958වේ දෙසැම්බර් මස 1 වැනි දින සිට විශේෂ කොමසාරිස්වරයා වශයෙන් වැලිගම නගරයේ කටයුතු පාලනය කරනු ඇතැයි 1958වේ නොවැම්බර් මස 21 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කාණ්ඩයේ පළවූ නිවේදනය මෙයින් අවලංගු කර සිටිනු ලැබේ.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩබලන පලාත් පාලන කොමසාරිස්.

---

### කොලොන්නාව පලාත් ආණ්ඩු සභාව

#### 1959 වර්ෂය පිළිබඳ වරිපණම් බදු

1939 අංක 61 දරණ පලාත් ආණ්ඩු සහා ආඥාපනතේ 173 වෙනි වගන්තිය අනුව කොලොන්නාව පලාත් ආණ්ඩු සහා සීමාව තුළ පිහිටි සෑම නිශ්චල දේපල සඳහා එම දේපලවල වාර්ෂික වටිනාකමෙන් සියයට දොළහ බැගින් පසුගිය වර්ෂයේ මෙන් වරිපණම් බදු පනවා ඇති බවද, එම වරිපණම් සතරෙන් එක් කොටස බැගින් 1959 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවල ගෙවිය යුතු බවද, නගරය තුළ ජලනල ක්‍රමය මගින් ජලය සැපයීම ආරම්භ කළ දින පටන් ජලය සපයන ප්‍රදේශවලට වරිපණම් සහ ජලය සඳහා සියයට 18 බද්දක් අය කරන බවද මින් දැනුම් දෙනු ලැබේ.

සී. අමරසිංහ,
සභාපති, කොලොන්නාව පලාත් ආණ්ඩු සභාව.

පලාත් ආණ්ඩු සභා කාර්යාලය.
කොලොන්නාව, 2. 12. 1958

## අතුරු ව්‍යවස්ථා

ඇල්. ජී. ඩී. ජීර් 25/17/20.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මාම්පේ-කැස්බෑව ගම් ප්‍රදේශයේ ගම්කායභා සභාව විසින් සම්පාදිතව 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන්, සංශොධිතවූ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පලාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන හා සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ.

#### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාව

1. (1) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ අය කරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙකු අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි සඳහන් "ඒ" උපලේඛනයෙහි පෝරමයේ ප්‍රකාර විස්තර උප ලේඛනයක් ප්‍රධාන තුමාට යැවිය යුතුයි. මේ පෝර්ම ගම්කායභා සභා කායභාලයෙන් ලබාගත හැක.

(2) ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ බද්ද ගෙවීමට බැඳී සිටින අය විසින් 1959 වැනි වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණකොට 1959 ජනවාරි මස 31 වැනි දින හෝ එයට මත්තෙන් ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය

ඒ වාහනය හෝ සතා හෝ අයිතිය හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව (1) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාවූ සැම අයෙක්ම තව දුරටත් දැනුම් දෙනු ලැබීමක් නැතිව—

(අ) උපලේඛනයේ සඳහන් රථවාහන හා සතුන් සඳහා වූ බද්ද 1959 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ එයට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

(ආ) ඊට පසු එක් එක් වර්ෂය වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් කරන ලදුව, එකී වර්ෂයේ දවස් 30ට වැඩි කාලයක් තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ එකී රථවාහන හා සතුන් සඳහාවූ බද්ද, එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත් වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපවූවාට පසු යම්කිසිවෙකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ආඥාපනත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කරගෙන, තබා ගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් හෝ (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම් කිසිවෙකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක් හෝ සතෙකු පළමු වන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේ නම් එවිට ඒ අය විසින් එබඳු යම් රථ වාහනයක් හෝ සතෙකු අත්පත් කර ගැනීමේ හෝ තබාගැනීමේ නොහොත් පාවිච්චි කිරීමට පටන්ගැනීමේ දින සිට එක මාසයක් ඇතුලතදී සාමාන්‍යයෙන් මීට යාකොට ඇති "ඒ" උපලේඛනයේ සඳහන් පෝරමයේ ප්‍රකාරයට ලියවිල්ලකින්වූ දන්වීමකින් එසේ අත්පත් කරගත් බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

4. ආඥාපනතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධාන වලට යටත්ව (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවා වූ සැම අයෙක්ම, එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන්ද ඊට පසු සැම අවුරුද්දක් වෙනුවෙන්ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් සඳහා වූ බද්ද, ඒ සඳහා ප්‍රධානතුමා විසින් තමාට දැනුම් දෙනු ලබන යම් කාල සීමාවක් ඇතුලත දී ගෙවීමට බැඳී සිටිති.

5. (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනයේ හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුලත් කළාවූ හෝ ලේඛනයේ සඳහන් කළාවූ හෝ යම් රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥාපනතෙ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සැම අයෙකු විසින්ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින්නේ අසවල් අසවල් හේතුන් නිසා යයි දක්වෙන ලියවිල්ලකින් වූ දන්වීමක් වහාම ප්‍රධානතුමාට යැවිය යුතුයි.

(2) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ (3) වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළා වූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියා වූ සැම අයෙකු විසින්ම ලියවිල්ලකින් වූ දන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චි කිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම් අත්හල බව වහාම ප්‍රධාන තුමා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. යම් කිසිවෙකු විසින් බද්ද ගෙවූවිට ප්‍රධාන තුමා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධාරියෙකු විසින් ඒ බද්ද ගෙවූ රථ වාහන වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් කොට ඇති "බී" උපලේඛනයෙහි දක්වෙන පරිදි ඒ ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශේෂ අකුරුද තහඩුව නිකුත් කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහන තහඩු පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත් කළ යුතුයි. එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් එය ප්‍රධාන තුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත පණහක් ගෙවූවිට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බැව් දිව්රුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධානතුමාට ඒත්තු ගැනීමට සැලැස්සුවහොත් එතුමා විසින් අයිතිකාරයාගේ ඉල්ලීම පිටත් ඔහු විසින් ශත හැටක් ගෙවනු ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත් කළ හැකිය.

7. සැම රථවාහනයකම අයිතිකරු විසින් හෝ භාරකරු විසින් 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනුවෙන් නිකුත් කරන ලද තහඩුව, ඒ රථවාහනයේ කාටත් පෙණෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධාන තුමා විසින් හෝ එතුමාගේ ලියවිල්ලකින් බලයලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනා ගමනයෙහි යෙදී තිබෙන රථවාහනයක්, ඒ රථවාහනයෙහි (7) වැනි අතුරු ව්‍යවස්ථාවෙහි ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩුව පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානුකූල වන්නේය. තවද ප්‍රධාන තුමා විසින් හෝ එකී නිලධාරියා විසින් හෝ ඉල්ලීමක් කර සිටින කල්හි එකී ඕනෑම රථයක භාරකාරයා විසින් හෝ ඒ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධාන තුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂාකර බැලීමට ඉඩදිය යුතුයි.

9. රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් මාම්පේ-කැස්බෑව ගම්කායශී සභාව විසින් සංශෝධිත 1941 සැප්තැම්බර් මස 26 වැනි දින හා අංක 8,796 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරණු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කායශී සභාවේ ප්‍රධාන තුමා අදහස් කරණු ලැබේ.

"කායශී සභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ මාම්පේ-කැස්බෑව ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව අදහස් කරණු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත (198 පරිච්ඡේදය) අදහස් කරුණු ලැබේ.

## "ඒ" උපලේඛනය

### පෝරමය

අංකය :

කොට්ඨාශයේ අංකය :

මාම්පේ-කැස්බෑව ගම් ප්‍රදේශයේ ගම්කායශී සභාව රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයිය යුතු රථවාහන හා*/හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නම :————.

ගම :————.

තැපැල් :————.

| රථවාහන හා/*හෝ සතුන් පිළිබඳ විස්තරය | ගණන වචන වලින් | වෙනත් විස්තර (බයිසිකලයක් නම් එහි වර්ගය හා නොම්මරය සඳහන් කරනු) |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ රථ හැර වෙනත් ඕනෑම අන්දමක වාහන ... ... | | |
| ඕනෑම අන්දමක ගොන්දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... | | |
| තනිගොනා බඳින බරබාග කරත්ත හෝ තිරික්කල, අත්කරත්ත ... | | |
| ජින් රික්ෂෝ රථ ... ... | | |
| බයිසිකල් (සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) ... ... | | |
| අලි ... ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මෙහි ඉහත සඳහන් විස්තර සැම අතින්ම සත්‍ය බවත් නිවැරිදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයිතිකාරයාගේ අත්සන.

දිනය :————.

* අනවශ්‍ය වචන කපා හරිනු.

## "බී" උපලේඛනය

### පෝරමය

| | |
|---|---|
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ රථයක් හැර වෙනත් ඕනෑම අන්දමක වාහනයක් සඳහා ... ... | මා. කැ. ර. |
| ඕනෑම අන්දමක ගොන්දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | මා කැ. බ. ක. |
| තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | මා. කැ. ක. |
| සැම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... | මා. කැ. රි. |
| සැම බයිසිකලයක් සඳහා ... ... | මා. කැ. බ. |

තහඩුවල හැඩය සහ පාට සභාපති තැන විසින් නියම කරනු ලැබේ.

ඇල්. ජී. ඩී. ජීර් 14/26.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥා පනතේ (198 වෙනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල උඩුගහ පත්තු ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට් අතිරේකයේ" පළවූ ප්‍රකාශණයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථා

### ගොඩනැගිලි හා මායිම් තාප්ප තැනීම

1. කිසිවෙකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) ඕනෑම ගම්බද පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ආ) යථා කාලයේදී ගම්බද පාරක් බවට පත් කරනු ලැබිය හැකි යයි කාර්‍ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම අඩි පාරක් මැද සිට අඩි පහළොවක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ඕ) උප ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් බාහිරවූ ඕනෑම ගම්බද මාවතක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදිය යුතු නැත.

2. කිසිවකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමකින් දවස් තිහකට කලින් ඒ පිළිබඳව ප්‍රධානතුමාට දැනුම් නොදී මේ අතුරු ව්‍යවස්ථාවේ (1) වෙනි ඡේදයේ සඳහන් කරන ලද ඕනෑම පාරක් හෝ මාවතක් හෝ අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ගම් ප්‍රදේශය ඇතුළත සෑදිය යුතු නැත.

3. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍ය සභාව" යනුවෙන් ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

"ගම්බද මාවත" යනුවෙන් පළලෙන් අඩි හයකට නොඅඩු හා අඩි නවයකට අඩු මාවතක් අදහස් කරනු ලැබේ.

"ගම්බද පාර" යනුවෙන් පළලෙන් අඩි නවයකට අඩු නොවූ පාරක් අදහස් කරනු ලැබේ.

"ගම් ප්‍රදේශය" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ හංවැල්ල උඩු ගහ පත්තු ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

---

ඇල්. ඩී.—බී. 14/48.

ඇල්. ජී. ඩී.—ජී.අයි. 11/6ඩී.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිත වූ, 1947 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලනය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 27 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

### අශුචි ඉවත් කිරීම හා කශල ශෝධනය

1. (1) කාර්‍ය සභාව විසින් සම්මත කර ගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවල 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාවට ගෙවිය යුතු අශුචි ඉවත් කිරීමේ මාසික ගාස්තුව එක් එක් බාල්දිය සඳහා රුපියල් එක ගණනේ විය යුතු වන්නේ ය.

2. කාර්‍ය සභාව විසින් සම්මත කරගන්නා ලද අශුචි ඉවත් කිරීම හා කසළ ශෝධනය පිළිබඳ පොදු අතුරු ව්‍යවස්ථාවල 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ දක්වෙන කාරණා සඳහා කාර්‍ය සභාවට ගෙවිය යුතු කශල ශෝධන මාසික ගාස්තුව ශත පනහක් වන්නේ ය.

3. මේ අතුරු ව්‍යවස්ථාවල—

"කාර්‍ය සභාව" යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

---

ජී. බී. 14/31/7.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද උප නීති.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය කාර්‍යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 27 වෙනි දින,
කොළඹදීය.

### උප නීති

### ආයුර්වේද බෙහෙත් ශාලා

1. ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 43 (ඕඕ) වැනි වගන්තිය යටතේ කාර්‍ය සභාව විසින් අකුරැස්සේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්‍ය සභාව විසින්ම නඩත්තු කළ යුතුවත් හැර 1941කේ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නා වූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේ ය.

2. 1 වැනි උප නීතියේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයකු විසින් හෝ කාර්‍ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියෙකු විසින් හෝ කාර්‍ය සභාව විසින් නියම කරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලවු පිළිබඳ යම් යම් පොත්පත් හා වෙනත් එබඳු ස්ථානද කාර්‍ය සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේ ය.

3. කාර්‍ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්‍ය සභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළහැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාර්‍ය සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හෝ වරින් වර කාර්‍ය සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් හෝ මුදල් වෙන් කළයුතුද වන්නේ ය.

4. 5 වැනි උප නීතියේ සඳහන් විධිවිධාන වලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම නොමිලයේ විය යුතු වන්නේ ය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධවල වටිනාකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 25 බැගින් වූ ගාස්තුවක් කාර්‍ය සභාව විසින් අයකළ යුතුය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ කාර්‍ය සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයකින් රෝගියෙකුගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන් ම වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතු වන්නේය. එකී සෑම කුවිතාන්සියකම කාබන් අනුපිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙලින් අංක යොදා තිබිය යුතුද වන්නේ ය.

6. සභාපති තුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත් කම නිසා 5 වැනි උප නීතියේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියෙකු නිදහස් කළ හැකි වන්නේ ය.

7. ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා හිතවතුන්ගෙන් ලැබෙන යම් යම් පරිත්‍යාග මුදල් එකී බෙහෙත් ශාලාවේ වියහියදම් පියවා ගැනීම පිණිස ප්‍රයෝජනය ගතයුතු වන්නේ ය.

8. සභාපති තුමා විසින් දෙසැම්බර් මාසයේ 31 වැනිදායින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියපැහැදම් වන මුදල් ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතු වන්නේ ය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාර්‍ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ;

"සභාපතිතුමා" යනුවෙන් කාර්‍ය සභාවේ සභාපති තුමා අදහස් කරනු ලැබේ;

"කාර්‍ය සභාව" යනුවෙන් මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ.

ඇල්. ඩී.—බී 73/48 / ඇල්.ජී.ඩී.—ජීඒ 11/59/7.

### ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ වැල්ලවාය ගම්ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ "ගැසට්" අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ.

#### අතුරු ව්‍යවස්ථාව

1953 මැයි 8 වැනි දින අංක 10,524 දරණ රජයේ "ගැසට්" පත්‍රයෙහි පළකරන ලද අතුරු ව්‍යවස්ථා, එහි 58 වැනි අතුරු ව්‍යවස්ථාව අවලංගු කිරීමෙන් "රථවාහන ගමනාගමනය විධිමත් කිරීම" යන ශීර්ෂය යටතේ මෙයින් සංශෝධනය කරනු ලැබේ.

---

ඇල්. ඩී.—බී 83/46/ඇල්.ජී.ඩී.—ජීඒ 11/37/10.

### ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ බදුළු දිස්ත්‍රික්කයේ බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මඳක් වෙනස් කරන ලද එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද උප නීති.

වි. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

1958 නොවැම්බර් මස 28 වෙනි දින,
කොළඹදීය.

### උප නීති

#### ආයුර්වේද බෙහෙත් ශාලා

1. ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදය) 43 (බීබී) වැනි වගන්තිය යටතේ කාරක සභාව විසින් හැකැක්මේ පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාරක සභාව විසින්ම නඩත්තු කළයුතු වාත් හැර 1941කෝ අංක 17 දරණ ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥපනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නා වූ අයෙකු භාරයේ තැබිය යුතුද වන්නේය.

2. 1 වැනි උප නීතියේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයකු විසින් හෝ කාරක සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියෙකු විසින් හෝ කාරක සභාව විසින් නියම කරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන් වූ ගණන් හිලව් පිළිබඳ යම් යම් පොත පත හා වෙනත් එබඳු ස්ථානද කාරක සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙලකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේය.

3. කාරක සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාරකසභා පොදු අරමුදලෙන් අවුරුදු පතා ලබාගෙන පරිහරණය කළ හැකි අතර එසේ පරිහරණය කිරීම සඳහා කාරක සභාවේ වාර්ෂික අයවැය ලේඛනයෙන් හෝ වරින් වර කාරක සභාව විසින් සම්මත කරගනු ලබන අතිරේක ඇස්තමේන්තු වලින් හෝ මුදල් වෙන්කළ යුතුද වන්නේය.

4. 5 වැනි උප නීතියේ සඳහන් විධිවිධානවලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර නොමිළයේ සැපයිය යුතුවාත් හැර එකී ප්‍රතිකාර බෝගොඩ ගම් ප්‍රදේශයේ පදිංචිකරුවන්ට සීමාවිය යුතුද වන්නේය.

5. ආයුර්වේද බෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධවල වටිනාකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 25 බැගින් වූ ගාස්තුවක් කාරක සභාව විසින් අය කළ යුතුය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියෙකු විසින් හෝ කාරක සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයකින් රෝගියෙකුගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන්ම වහාම කුවිතාන්සියක් නිකුත් කළයුතු වන්නේය. එකී සෑම කුවිතාන්සියකම කාබන් අනු පිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙලින් අංක යොදා තිබිය යුතුද වන්නේය.

6. සභාපතිතුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි උප නීතියේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියෙකු නිදහස් කළහැකි වන්නේය.

7. ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා යම් යම් හිතවතුන්ගෙන් ලැබෙන යම් යම් පරිත්‍යාග මුදල් එකී ආයුර්වේද බෙහෙත් ශාලාවේ වියහියදම් පියවා ගැනීම සඳහා යෙදවිය යුතුද වන්නේය.

8. සභාපතිතුමා විසින් දෙසැම්බර් මාසයේ 31 වැනිදයින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් වියපැහැදම් වන මුදල්ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතු වන්නේය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාරක සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ;

"සභාපතිතුමා" යනුවෙන් කාරක සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ;

"කාරක සභාව" යනුවෙන් බදුළු දිස්ත්‍රික්කයේ බෝගොඩ ගම් ප්‍රදේශයේ ගම්කාරක සභාව අදහස් කරනු ලැබේ.

---

# අය වැය ලෙඛන

## අම්බලන්ගොඩ නගර සභාව

### 1959 වර්ෂයට සකස් කරන ලද අය වැය ලේඛනය

| අය | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය :— | | |
| (1) වරිපනම් බද්ද ... ... ... | 54,000 | 0 |
| (2) අක්කර බද්ද ... ... ... | — | |
| (3) වාහන හා සත්ව බද්ද ... ... | 600 | 0 |
| (4) බලපත්‍ර ගාස්තු ... ... ... | 10,000 | 0 |
| (5) වෙනත් අය බදු ... ... ... | — | |
| (6) මුද්දර ගාස්තු ආපසු ගෙවීම ... ... | 1,000 | 0 |
| (7) රටබීම තැබෑරුම් රේන්ද ගාස්තු ආපසු ගෙවීම ... | 400 | 0 |
| (8) අබින් ආදයම් පිළිබඳ වන්දිය ... ... | 3,750 | 54 |
| (9) උසාවියෙන් පනවන ලද දඩ මුදල් (අන්තැනක ඇතුළත්කර නොමැති) ... ... ... | 100 | 0 |
| (10) වෙන්දේසිකරුවන්ගේ සහ බ්‍රෝකර්වරුන්ගේ බලපත්‍ර ... | 150 | 0 |
| (11) පොලිය ... ... ... | 900 | 0 |
| (12) පරණ ගබඩා ද්‍රව්‍ය විකිණීම ... ... | 300 | 0 |
| (13) වැඩිපුර ගෙවූ මුදල් ආපසු ලබා ගැනීම ... | 180 | 0 |
| (14) මිශ්‍ර ආදයම ... ... ... | 500 | 0 |
| (15) වරෙන්තු ගාස්තු ... ... ... | 1,500 | 0 |
| (16) ලේකම් කාර්‍යමණ්ඩලයෙන් විදුලි දෙපාර්තමේන්තුවට දෙන සේවාවන් වෙනුවෙන් ගෙවන ආධාර මුදල් ... | 3,500 | 0 |
| (17) ජීවනාධාර මුදල් ගෙවීම හැකිවනු සඳහා රජයෙන් දෙන ආධාර මුදල් ... ... ... | 85,733 | 0 |
| (18) රජයෙන් ලැබෙන එක්වන් ආධාර මුදල ... | 31,276 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) පාරේ වැඩ කිරීමේ බද්ද වෙනුවට දෙන ආධාර මුදල් ... | 3,250 | 0 |
| (2) වෙනත් අයකිරීම් (දඩාවතේ යන ගවයන් ඇල්ලීමේ හා අයාලයේ තැබීමේ ගාස්තු සහ බස් නැවතුම් පොලවල් පිළිබඳ ගාස්තු ආදිය) ... ... | 500 | 0 |
| සී.—තානායම් හා අම්බලම් :— | | |
| (1) ගාස්තු ... ... ... | 6,500 | 0 |
| (2) වෙනත් ගාස්තු ... ... ... | — | |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (1) කුලී ... ... ... | 2,820 | 0 |
| (2) වැවිලි ඵලයන් විකිණීම ... ... | 618 | 80 |
| (3) ඉඩම් විකිණීම ... ... ... | — | |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | |
| (1) සාමාන්‍ය— | | |
| (ඒ) තෙවැනි නීති සංග්‍රහයේ 4 වැනි කාණ්ඩය යටතේ දඩ මුදල් ... ... ... | 50 | 0 |
| (බී) වින්නඹු මාතාවන්ගේ සේවාවන්ට ගෙවන ගාස්තු ... | — | |
| (සී) මාතෘ නිවාසය සහ දරකාභිවෘධි මධ්‍යස්ථානය— | | |
| (1) රජයේ ආධාර ... ... | 500 | 0 |
| (2) වෙනත් ලැබීම් ... ... | — | |
| (2) කුණු කසළ බැහැරලීම— | | |
| (ඒ) ගාස්තු ... ... ... | — | |
| (බී) කුණුරොඩු විකිණීම ... ... | — | |
| (සී) කොන්ත්‍රාත්කරුවන්ට සහ කුලීකරුවන්ට දඩ ගැසීම් | 50 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| (3) වැසිකිළි ශුද්ධ කිරීම :— | | |
| (ඒ) ගාස්තු | 180 | 0 |
| (බී) කසළ විකිණීම | 480 | 0 |
| (සී) කොන්ත්‍රාත්කරුවන්ට සහ කුලීකරුවන්ට දඩ ගැසීම | 50 | 0 |
| (4) ගවඝාතක මඩුව සහ ගවගාල— | — | |
| (ඒ) ගාස්තු | — | |
| (බී) ගොම රොඩු ආදිය විකිණීම | — | |
| (5) ජල සම්පාදනය— | | |
| (ඒ) වතුර බද්ද | — | |
| (බී) පුද්ගලික ජල සේවාවන් පිළිබඳ ගාස්තු | — | |
| (6) ආරෝග්‍ය ශාලා— | | |
| (ඒ) රජයේ ආධාර මුදල් | — | |
| (බී) රෝහල පිහිටි ඉඩමේ බදුකුලී | — | |
| (7) වෙළඳ පොලවල් සහ ගාල්— | | |
| (ඒ) බදු කුලී | 600 | 0 |
| (බී) කඩ කාමර සහ කඩ බක්කි | 24,696 | 10 |
| (සී) පුද්ගලික වෙළඳ පොලවල් වලින් ලැබෙන ගාස්තු | — | |
| (ඩී) බල පත්‍ර | — | |
| (ඊ) ධාන්‍ය ගබඩා බදු කුලී | — | |
| ඇෆ්.—මහජන ක්‍රීඩා :— | | |
| (1) බදු කුලී | 50 | 0 |
| (2) ගවයන් තණ කැවීමේ ගාස්තු | — | |
| (3) ප්‍රසිද්ධ රඟපෑම් පිළිබඳ බලපත්‍ර | 1,320 | 0 |
| (4) විනෝද බද්ද | 15,300 | 0 |
| ජී.—සොහොන් බිම් :— | | |
| (1) ගාස්තු | — | |
| (2) අවමඟුල් රථය කුලියට දීම | — | |
| (3) ස්මාරක තැනීම සඳහා මිනීවල් විකිණීම | — | |
| එච්.—සුනඛයින් ලියා පදිංචිකිරීම— | | |
| (1) ලියා පදිංචිකිරීමේ ගාස්තු | 50 | 0 |
| (2) දඩ මුදල් | — | |
| (3) බලු කරපටි විකිණීම | — | |
| (4) බල්ලන් ඇල්ලීමේ ගාස්තු | — | |
| අයි.—තරාදි පඩි සහ සේරු:— | | |
| (1) මුද්දර ගැසීමේ ගාස්තු | — | |
| (2) දඩ මුදල් | — | |
| ජේ.— විදුලි දෙපාර්තමේන්තුව:— | | |
| (1) විදුලි බලය විකිණීම | 1,64,900 | 0 |
| (2) මීටර් බදු කුලී | 7,500 | 0 |
| (3) මිලයට ගන්නන්ට කර දෙන වැඩ | 7,500 | 0 |
| (4) මිශ්‍ර ආදයම | 200 | 0 |
| (5) වැඩිපුර ගෙවීම් ආපසු දීම | 50 | 0 |
| (6) ජීවනාධාර මුදල් ගෙවීම සඳහා රජයේ දීමනාව | 22,500 | 0 |
| කේ.—ගින්නෙන් ආරක්ෂාව :— | | |
| (1) ගාස්තු | — | |
| (2) වෙනත් ගාස්තු | — | |
| ඇල්.—පලතුරු ගස් සැපයීම:— | | |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| (1) සාමාජික මුදල් | — | |
| සම්පූර්ණ අය | 4,53,554 | 44 |

## වැය

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වැය— | | |
| (1) නිලධාරීන්ගේ වැටුප් (අන්තැනක වැය නොවන)— | | |
| (ඒ) ලේකම් තැන | 3,420 | 0 |
| (බී) ලිපිකරුවන් සහ ආදයම් පරීක්ෂකවරුන් | 14,166 | 0 |
| (සී) පියන්වරු | 804 | 0 |
| (ඩී) කාර්මික උපදේශකයන් වෙනුවෙන් වියදම් | — | |
| (ඊ) විශ්‍රාම වැටුප් | 1,500 | 0 |
| (2) කාර්‍යමණ්ඩලීය වියදම්— | | |
| (ඒ) අමතර දීමනා | 3,244 | 0 |
| (බී) ගමන් ගාස්තු | 1,278 | 0 |
| (සී) අයබදු එකතුකරන්නන්ට කොමිස් | — | |
| (ඩී) තක්සේරුකාර තැනගේ ගාස්තු | — | |
| (ඊ) අධිකරණ ගාස්තු ... | 500 | 0 |
| (ඇෆ්) ලිපි, ද්‍රව්‍ය, මුද්‍රණ, ප්‍රසිද්ධ කිරීම් සහ කාර්‍යාලයීය කටයුතු | 5,000 | 0 |
| (ජී) ඡන්දදායකයින් ලියාපදිංචිකිරීම සහ මැතිවරණ | — | |
| (එච්) කරත්ත, ඔරු සහ වරිපනම් නොමමර තහඩු පිළිබඳ වියදම් | 200 | 0 |
| (අයි) ගණන් පරීක්ෂක ගාස්තු | 1,750 | 0 |
| (ජේ) විවේක ගමන් ගාස්තු සඳහා දුම්රිය ප්‍රවේශ පත්‍ර | 750 | 0 |
| (කේ) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 16,240 | 0 |
| (3) ආපසු ගෙවීම් | 50 | 0 |
| (4) ආධාර මුදල් සහ දීමනා | 855 | 0 |
| (5) පාඨශාලීය පොත් නොමිලයේ දීම | 1,000 | 0 |
| බී.—මංමාවත් :— | | |
| (1) වැටුප් සහ පඩි නඩි— | | |
| (ඒ) වැඩ පරිපාලකතැන (වේතන සහ අමතර දීමනා) | 4,511 | 0 |
| (බී) ඕවර්සියර්වරු ... | 621 | 0 |
| (සී) කම්කරුවෝ ... | 4,200 | 0 |
| (2) නඩත්තුව | 4,000 | 0 |
| (3) යන්ත්‍ර හා උපකරණ | 250 | 0 |
| (4) වීථි ආලෝක කිරීම | 20,000 | 0 |
| (5) දූවිලි නැගීම වැලැක්වීම | — | |
| (6) සළකුණු හා සංඥාපුවරු පිළිබඳ වියදම් | 100 | 0 |
| (7) ඉඩම් ලබාගැනීම | 7,000 | 0 |
| (8) සංවර්ධනය | 17,500 | 0 |
| (9) ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය | 5,237 | 60 |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස | 6,260 | 0 |
| (10) සෙවන දෙන ගස් | — | |
| (11) මැණීම් | 500 | 0 |
| (12) අළුත් වැඩ | 12,000 | 0 |
| (13) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 9,923 | 16 |
| සී.—තානායම් සහ අම්බලම් :— | | |
| (1) වැටුප් | 644 | 0 |
| (2) නඩත්තුව | 3,500 | 0 |
| (3) ගෘහ භාණ්ඩ සහ උපකරණ | 1,000 | 0 |
| (4) සංවර්ධන | 1,000 | 0 |
| (5) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 959 | 64 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි:— | | |
| (1) වැටුප් | 675 | 0 |
| (2) එකතුකරන්නන්ගේ කොමිස් | — | |
| (3) කාර්‍යාලයීය බදු කුලිය | — | |
| (4) නඩත්තුව | 3,000 | 0 |
| (5) දැව භාණ්ඩ | 2,000 | 0 |
| (6) ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය | 1,678 | 82 |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස | 3,228 | 50 |
| (7) අළුත් වැඩ | 500 | 0 |
| (8) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම | 1,200 | 0 |
| ඊ.—මහජන සෞඛ්‍යය:— | | |
| (1) සාමාන්‍ය වැය — | | |
| (ඒ) වැටුප් (පරීක්ෂාකරුවන්ගේ සහ වින්නඹුමාතාවන්ගේ පඩිනඩි) | 6,150 | 0 |
| (බී) අමතර දීමනා | 1,133 | 0 |
| (සී) නිල ඇඳුම් | 100 | 0 |
| (ඩී) මුද්‍රණ වැඩ | 50 | 0 |
| (ඊ) විශබීජ නාශක ද්‍රව්‍ය | 1,000 | 0 |
| (ඇෆ්) උපකරණ හා වෙනත් ද්‍රව්‍ය | 200 | 0 |
| (ජී) වතුර බැස්වීමේ කාණු තැනීම | 1,500 | 0 |
| (එච්) වතුර බැස්වීම පිළිබඳ වන්දි ගෙවීම | — | |
| (අයි) සෞඛ්‍ය සතිය සඳහා වියදම් | 100 | 0 |
| (ජේ) කිරි පරීක්ෂණ පිළිබඳ ගාස්තු | 200 | 0 |
| (කේ) වසන්ගත රෝග මර්දන කටයුතු | 50 | 0 |
| (ඇල්) මසූරිකා රෝග මර්දන කටයුතු ... | — | |
| (ඇම්) මාතෘ නිවාසය හා දරකාභිවෘධි චිකිත්සාගාරය | 2,000 | 0 |
| (ඇන්) කාණු නඩත්තු කිරීම | 50 | 0 |
| (ඕ) ක්ෂය රෝග මර්දන කටයුතු | 100 | 0 |
| (පී) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 5,000 | 0 |
| (2) කුණුකසළ බැහැරලීම— | | |
| (ඒ) පඩිනඩි | 13,946 | 96 |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි | 3,040 | 0 |
| (සී) ගබඩා බඩු | 600 | 0 |
| (ඩී) කුණු මෝල | — | |
| (ඊ) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 25,006 | 0 |
| (3) වැසිකිළි ශුද්ධකිරීම— | | |
| (ඒ) පඩිනඩි | 15,750 | 0 |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි | 3,200 | 0 |
| (සී) ගබඩා බඩු | 1,000 | 0 |
| (ඩී) අශුචි රැස්කරන ස්ථානයේ කුලිය | — | |
| (ඊ) වැසිකිළි නඩත්තුව | 1,000 | 0 |
| (ඇෆ්) ඉඩම් ලබාගැනීම | — | |
| (ජී) ගොඩනැගිලි තැනීම | — | |
| (එච්) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් | 23,805 | 60 |
| (4) ගවඝාතක මඩුව සහ ගවගාල— | | |
| (ඒ) පඩිනඩි | 744 | 80 |
| (බී) නඩත්තුව | — | |
| (සී) ඉඩම් ලබාගැනීම | — | |
| (ඩී) ගොඩනැගිලි තැනීම | — | |
| (ඊ) ගව රෝග | — | |
| (ඇෆ්) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම | 1,165 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| (5) ජල සම්පාදනය— | | |
| (ඒ) පඩි නඩි ... ... ... | — | |
| (බී) ගබඩා බඩු ... ... ... | — | |
| (සී) නඩත්තුව ... ... ... | 100 | 0 |
| (ඩී) ඉඩම් ලබාගැනීම ... ... | — | |
| (ඊ) ගොඩනැගිලි තැනීම ... ... | — | |
| (ඇෆ්) ණය ගෙවීම ... ... | — | |
| (ජී) බදු එකතුකරන්නන්ට කොමිස් ... ... | — | |
| (එච්) ප්‍රසිද්ධ නාන ස්ථාන ... ... | 1,000 | 0 |
| (6) ආරෝග්‍යශාලා— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | — | |
| (බී) නඩත්තුව ... ... ... | — | |
| (සී) දිළින්දන් ... ... ... | 50 | 0 |
| (7) වෙළඳ පොලවල් සහ ගාල්— | | |
| (ඒ) පඩිනඩි ... ... ... | 1,087 | 60 |
| (බී) නඩත්තුව ... ... ... | 3,000 | 0 |
| (සී) මුද්‍රණ වැඩ ආදිය ... ... | 25 | 0 |
| (ඩී) ගොඩනැගිලි තැනීම ... ... | — | |
| (ඊ) වන්දි ගෙවීම ... ... ... | — | |
| (ඇෆ්) ඉඩම් ලබාගැනීම ... ... | — | |
| (ජී) ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය ... ... ... | 416 | 0 |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස ... | 1,400 | 0 |
| (එච්) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම | 1,518 | 0 |
| ඇෆ්.—මහජන ක්‍රීඩා— | | |
| (1) පඩිනඩි ... ... ... | — | |
| (2) නඩත්තුව ... ... ... | 1,000 | 0 |
| (3) බැන්ඩ් වාදක කණ්ඩායමට දීමනා ... ... | — | |
| (4) ඉඩම් ලබාගැනීම ... ... ... | — | |
| (5) ආධාර මුදල් සහ දීමනා ... ... | 250 | 0 |
| ජී.—සොහොන් බිම් :— | | |
| (1) පඩිනඩි ... ... ... | — | |
| (2) නඩත්තුව ... ... ... | 500 | 0 |
| (3) ගොඩනැගිලි තැනීම ... ... | 2,500 | 0 |
| එච්.—සුනඛයින් ලියා පදිංචි කිරීම :— | | |
| (1) බල්ලන් විනාශ කිරීම ... ... | 550 | 0 |
| (2) බදු එකතුකරන්නන්ට කොමිස් ... ... | — | |
| (3) බලු කරපටිවල වියදම ... ... | — | |
| (4) බල්ලන් අල්ලන්නන්ට ගාස්තු ... ... | — | |
| (5) බලු ගාල නඩත්තු කිරීම ... ... | — | |
| (6) ගොඩනැගිලි තැනීම ... ... | — | |
| අයි.—තරාදි පඩි සහ සේරු :— | | |
| (1) පරීක්ෂකවරුන්ගේ ගාස්තු ... ... | — | |
| (2) ගබඩා බඩු ... ... ... | — | |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| (1) විදුලි බල නිෂ්පාදනය— | | |
| (ඒ) පුළුස්සන තෙල් ... ... | 15,000 | 0 |
| (බී) යාන්ත්‍රික තෙල්, පිසදමන ද්‍රව්‍ය සහ යන්ත්‍රාගාරයේ බඩු | 1,500 | 0 |
| (සී) වැඩ සඳහා වැටුප් සහ පඩිනඩි ... ... | 3,726 | 0 |
| (ඩී) විදුලිබලය මිලයට ගැනීම ... ... | 40,000 | 0 |
| (2) අළුත් වැඩියා කිරීම සහ නඩත්තුව— | | |
| (ඒ) ගොඩනැගිලි ... ... ... | 2,000 | 0 |
| (බී) ඇන්ජින්, බොයිලේරු සහ යන්ත්‍රාදිය ... | 250 | 0 |
| (සී) මීටර්, සුවිච් යතුරු සහ වෙනත් උපකරණ ... | 9,000 | 0 |
| (ඩී) විදුලි බලය සපයන සහ බෙදාහරින කම්බි නඩත්තු කිරීම | 4,000 | 0 |
| (3) කම්බිවලට සහ නිවෙස්වලට යා කිරීමේ සේවයන්— | | |
| (ඒ) ද්‍රව්‍ය ... ... ... | 10,000 | 0 |
| (බී) තාවකාලික කම්කරුවන් ... ... | 50 | 0 |
| (4) පාලනය සහ සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) පඩි නඩි (විදුලි කාර්මිකයන් සහ ලිපිකරුවන්) ... | 9,718 | 8 |
| (බී) පඩිනඩි (පිට වැඩකරුවන්) ... ... | 8,500 | 0 |
| (සී) මුද්‍රණ වැඩ සහ ලිපි ද්‍රව්‍ය ... ... | 500 | 0 |
| (ඩී) විවිධ සුළු සේවාවන් ... ... | 4,000 | 0 |
| (ඊ) ගණන් පරීක්ෂක ගාස්තු ... ... | 1,250 | 0 |
| (ඇෆ්) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් ... | — | |
| (ජී) කාර්‍ය මණ්ඩලයෙන් විදුලි දෙපාර්තමේන්තුවට කළ සේවාවන්ට ගෙවීම් ... ... | 3,500 | 0 |
| (එච්) විවේක ගමන් ගාස්තු සඳහා දුම්රිය ප්‍රවේශ පත්‍ර | 500 | 0 |
| (5) ණය ගෙවීම— | | |
| (ඒ) පොලිය ... ... ... | 4,225 | 36 |
| (බී) ණය මුදලෙන් ගෙවන කොටස ... ... | 14,198 | 68 |
| (6) දියුණුකිරීම් හා සංවර්ධන වැඩ ... ... | 5,000 | 0 |
| (7) වර්තිනාකම අඩුවීම නිසා වෙන්කරන ආරක්ෂක මුදල ... | 1,000 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| (8) ආපසු ගෙවීම් ... ... ... | — | |
| (9) ඇඩ්වාන්ස් මුදල් ආපසු ගෙවීම ... ... | — | |
| (10) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් ... | 22,500 | 0 |
| කේ.—ගින්නෙන් ආරක්ෂාව :— | | |
| (1) ගිනි නිවීමේ උපකරණවල ගාස්තු ... ... | 500 | 0 |
| ඇල්.—පලතුරු ගස් සැපයීම :— | | |
| (1) පඩිනඩි ... ... ... | — | |
| (2) නඩත්තුව ... ... ... | — | |
| (3) වෙනත් වැය ... ... ... | — | |
| ඇම්.—කියවීම් ශාලා සහ පුස්තකාල :— | | |
| (1) වැටුප් ... ... ... | 600 | 0 |
| (2) පොත්පත් ආදිය ... ... ... | 1,000 | 0 |
| (3) ද්‍රව භාණ්ඩ ... ... ... | 2,500 | 0 |
| (4) නඩත්තුව ... ... ... | 500 | 0 |
| (5) ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර දීමනා වියදම් ... | 915 | 60 |
| සම්පූර්ණ වැය ... | 4,48,967 | 40 |

| | | |
|---|---|---|
| 1959 වර්ෂයට සම්පූර්ණ අය | ... | 4,53,554 44 |
| 1959 වර්ෂයට සම්පූර්ණ වැය | ... | 4,48,967 40 |
| බලාපොරොත්තුවන ඉතිරිය | ... | 4,587 04 |

1958 වෙ නොවැම්බර් මස 22 වෙනි දින පැවැත්වූ සභාවේ සාමාන්‍ය රැස්වීමේදී සම්මුති අංක 22 යටතේ සකස් කිරීමෙන් පසු පිළිගන්නා ලදී.

සැම් රණසූරිය,
අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති.

22.11.1958.
නගර සභා කාර්‍යාලය,
අම්බලන්ගොඩ,

# විවිධ දැන්වීම්

## මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පල්ලේගම්පහ ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959යේ වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව පාතදුම්බර පල්ලේගම් ගම්කාර්‍ය සභා ප්‍රදේශයේ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානය |
|---|---|---|
| 1. ඇන්. ඇල්. ඒ. ලතීෆ්. | ... | පන්විල නොම්මර 18 දරන ස්ථානයේ හරක් මස් කඩයට |
| 2. කේ. ඒ. මහම්මදු යුසුප් | ... | උඩතලවින්න මඩිගේ ඇම්. සී. ඒ. ලෙබ්බෙට අයිති ස්ථානයේ හරක් මස් කඩයට |
| 3. ආර්. ඒ. හබිබු මොහමමදු | ... | කුරුදුගහඇල නොම්මර 48 දරණ ස්ථානයේ හරක් මස් කඩයට |
| 4. කේ. මොහිදීන් මීරාසයිබු | ... | පන්විල නොම්මර 101 දරණ ස්ථානයේ එළමස් කඩයට |
| 5. අයි. ඇල්. ඇම්. ඇස්. දීන් | ... | නවයාලතැන්නේ හරක් මස් කඩයට |

එච්. ඇම්. බී. උඩුරාවන,
පාතදුම්බර පල්ලේගම්පහ ගම්කාර්‍ය සභාවේ ප්‍රධාන තැන.

1958 දෙසැම්බර් මස 5 වෙනි දින,
පාතදුම්බර පල්ලේගම්පහ ගම්කාර්‍ය සභා කාර්‍යාලයේ ය,
යටවර, වත්තේගම.

## දෙඩන්ගස්ලන්ද ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලෙඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුඬව කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩන්ගස්ලන්ද ගම්කායයී සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත යටතේ 201 වෙනි පරිච්ඡේදයේ අං 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| (1) ඊ. පීරු මොහම්මදු ... | තෙලඹුගල්ල ... | හරක්මස් |

ඒ. ඊ. අහමදු මීරා සායිබු,
දෙඩන්ගස්ලන්ද ගම්කායයී සභාවේ ප්‍රධාන තැන.

1958 12. 2 වැනි දින,
ගම්කායයී සභා කායයීාලය,
දෙඩන්ගස්ලන්ද.

---

## ගොඩපිටිය ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලෙඛනයෙහි සඳහන් අය විසින් මස් මස් පිණිස සතුන් මරා විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඬවන ගොඩපිටිය ගම්කායයී සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ ගැන විරුඬවන්නේ අසවල් කරුණු නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිට පත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවෙන දින සිට දින දහතරක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥපනතේ 201 පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 ආඥපනතේ සංශෝධිතවූ අක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ සවභාව | ස්ථානය |
|---|---|---|
| (1) ඇම්. ඇල්. ඇම්. සුලෙයි මන් | හරක් හා එළුමස් කඩය | තල්කනවිට, ගොඩ පිටිය |
| (2) ඒ. ආර්. ඇම්. ජුනයිදු... | එම ... | මූණමල්ගහඹවිට, ගොඩපිටිය |

එච්. බී. ජිනදස,
ගොඩපිටිය ගම්කායයී සභාවේ ප්‍රධාන තැන.

1958 දෙසැම්බර් 6 වන දින,
ගොඩපිටිය ගම්කායයී සභා කායයීාලය.

---

## උඩුනුවර කඳුපලාත ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණත

මෙහි පහත උපලෙඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථාන වල 1959 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපණතේ "201 වැනි පරිච්ඡේදයේ", 1947 අංක 44 දරණ සංශොධිත ආඥපණතේ 6 වැනි වගන්තියෙන් සංශොධනය කරන ලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපලාත ගම්කායයී සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුඬ වන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුඬ වන්නේ කුමන හේතූන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

### උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| (1) අයි. ඇල්. ඇම්. ලෙබ්බෙ ... | වෙලම්බොඩ ... | වෙලම්බොඩ, ගල්මුල්ලේ වත්ත. | ... හරක්මස් |
| (2) ඊ. ඇම්. රෂීඩ්... | වටදෙනිය, වෙලම්බොඩ | වෙලම්බොඩ දළුක් කොටුවේ පිහිටි හදිරම නොහොත් ගල්මුල්ල ... | හරක්මස් |
| (3) ඊනා. අසන් ලෙබ්බෙ ... | වටදෙනිය, වෙලම්බොඩ... | වටදෙනිය අටලහතැන්න කඩේ | ... හරක්මස් |
| (4) වී. ඒ. හමීඩ්... | කුරුකුත්තල, කඩුගන්නාව | කුරුකුත්තල ගල්පිහිල්ල වත්තේ කඩේ | ... හරක්මස් |

යූ. ඇල්. නූර්මොහමඩ්,
ගම්කායයී සභාවේ සභාපති තැන.

1958.4.12.
උඩුනුවර කඳුපලාත ගම්සභා කායයීාලය,
වෙලම්බොඩ.

---

## පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත දක්වෙන උපලෙඛනයෙහි සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1959යේ වර්ෂයේ මස් කඩයක් පවත්වාගෙන යෑමට බලපත්‍රයක් ඉල්ලුම්කර තිබෙන බැවින් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන පාතදුම්බර පලිස්පත්තුව බටහිර ගම්කායයී සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඒ කුමන කරුණු නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට සති දෙකක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වැනි පරිච්ඡදයේ අක 7 සහ 1947 අංක 44 දරන ආඥපනතින් සංශෝධිතවූ අංක 4 දරණ වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලෙඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| (1) ඒ. මොහම්මඩ් හාසිම්, දිගන, කෙංගල්ල | නො. 268, දිගන. හරක්මස් විකිණීම. |
| (2) ඇන්. අබ්දුල් හමීදු, කුඹුක් කදුර, තෙල්දෙනිය | අංක 7/2, කුඹුක්කදුර. හරක් මස් විකිණීම. |
| (3) ඊ. ඇම්. ඉස්මායිල්, කොස් ගම, මඩොල්කැලේ | හුලුගහ. හරක්මස් විකිණීම. |

එච්. ඇම්. හේරත් බන්ඩා,
පලිස්පත්තුව බටහිර ගම්කායයී සභාවේ සභාපති තැන.

ගම්සභා කායයීලය,
නාරන්පනාව, 1.12.58.

---

## උඩුගොඩ පල්ලේසියපත්තුව ගම්කායයී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලෙඛනයේ සඳහන් අය විසින් පහත දක්වෙන ස්ථානයේ 1959 වර්ෂයට මස්කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩුගොඩ පල්ලේසිය පත්තුවේ ගම්කායයී සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුඬ වන්නේ නම් ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට විසි එක් දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ හා 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලෙඛනය

**ඉල්ලුම්කරුගේ :** එලමල්පත පී. ඇම්. ජෙබර්දීන්.

**වෙළඳාම :** හරක්මස්.

**ස්ථානය :** මැදබැද්දේ කටුවේලන්දේ වත්ත.

ඇස්. ඇම්, කාසිම්,
ප්‍රධාන තැන.

වර්ෂ 1958ක් වූ දෙසැම්බර් මස 2 වෙනි දින,
උඩුගොඩ පල්ලේසිය පත්තුව ගම්සභා කායයීාලයේදීය.

## කම්මල් පත්තු ගම්කායයිං සභාව

### මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධ වන කම්මල් පත්තු ගම්කායයිං සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයෙහි පළවන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මැරීම පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | පදිංචි ස්ථානය | මැරීමට අදහස් කරන සතුන් |
|---|---|---|
| 1. ඩබ්ලිව්. ස්ටීවන් ප්‍රනාන්දු | කුලමුල්ල | හරක්, එළුවන් සහ ඌරන් |
| 2. බී. සෙබස්තියන් කෝස්තා | උල්හිටියාව | එම |

ඩබ්ලිව්. අයි. හියු ප්‍රනාන්දු,
කම්මල් පත්තු ගම්කායයිං සභාවේ ප්‍රධාන නැන.

වර්ෂ 1958 ක්වූ නොවැම්බර් මස 29 වැනි දින,
කම්මල් පත්තු ගම්කායයිං සභා කායයිංලයේදීය,
දුම්මලදෙනිය, වෙන්නප්පුව.

---

## අටුලුගම් කෝරළේ ගම්කායයිං සභාව—දෙහිඕවිට

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959යේ වර්ෂයට බල පත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බල පත්‍ර නිකුත් කිරීමට විරුද්ධව අටුලුගම් කෝරළේ ගම්කායයිං සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහා යයි, දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙන පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශොධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

උප ලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය. | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| *1. අයි. ඇල්. ඇම්. ෂෙයින් කෙළින් වීදිය, දරණියගල. ... | අංක 95, තැබෑරුම් වත්ත. | හරක්මස් |
| 2. ටී. ඇම්. ඉසාක්, අංක 3 සහ 4, යූ. සී. මාර්කට්, අවිස්සා වේල්ල. ... ... | අංක 380, තල්දූව. | හරක්මස් |
| 3. ටී. ඇම්. යූසුප්, අංක 1 සහ 2 යූ. සී. මාර්කට්, අවිස්සා වේල්ල. ... ... | අංක 487, තල්දූව. | හරක්මස් |
| 4. ටී. ඇම්. යූසුප්, අංක 1 සහ 2, යූ. සී. මාර්කට්, අවිස්සා වේල්ල. ... ... | අංක 56, ගුරුගල්ල | හරක්මස් |
| 5. ටී. ඇම්. යූසුප්, අංක 1 සහ 2, යූ. සී. මාර්කට්, අවිස්සා වේල්ල. ... ... | අංක 45, නාපාවල | හරක්මස් |

(* අංක 1 දරණ ඉල්ලුම්කරු බලපත්‍ර ඉල්ලා සිටින්නේ හරක්මස් වෙළඳාමට පමණයි.)

මා. ග. ජයවර්ධන,
අටුළුගම් කෝරළේ ගම්කායයිං සභාවේ ප්‍රධාන නැන.

ගම්කායයිං සභා කාර්යාලය, දෙහිඕවිට,
1958. 12. 4 දින දීය.

## හලාවත දිස්ත්‍රික්කයේ මැදපළාත ගම්කායයිං සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959යේ වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව හලාවත දිස්ත්‍රික්කයේ මැදපළාත ගම්කායයිං සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකක් සිටිනසේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. ඇම්. එච්. අන්තෝනි අප්පු හාමි, මූදුකටුව, මාරාවිල ... | මූදුකටුවේ ඒ. ඒ. සෙලෙස්තිනා පෙරේරා මහත්මියට අයිති මූදුකටුවේ පිහිටි කොස්ගහවත්ත නමැති ඉඩමේ පිහිටි මස් කඩය—හරක්මස්, එළුමස්, සහ ඌරු මස්. |
| 2. එච්. ඇම්. රෙසීන්, ඉහළ කොට්ටරාමුල්ල, ලුණුවිල ... | නාත්තන්ඩියේ ඇම්. අබ්දුල් හමීඩ් මහත්මියට අයිති නාත්තන්ඩියේ නගරයේ පිහිටි තක්සේරු අංක 292 දරණ ගොඩනැගිල්ල—හරක්මස් සහ එළුමස්. |
| 3. ඇස්. ඇම්. ඩීන්, ඉහළ කොට්ටරාමුල්ල, ලුණුවිල ... | මාවිල ඒ. ඇම්. පීටර් කෝස්තා මහත්මයාට අයිති තුම්මෝදර පිහිටි නිදිකුම්බ වත්ත—හරක්මස් සහ එළුමස්. |
| 4. එච්. ඇම්. නාසිම්, ඉහළ කොට්ටරාමුල්ල, ලුණුවිල ... | ඉහළ කොට්ටරාමුල්ලේ අයිසි ලෙබ්බේ මරික්කාර් අරූපා උම්මා මහත්මියට අයිති ඉහළ කොට්ටරාමුල්ලේ පිහිටි කැටකාලගහවත්ත නමැති ඉඩමේ පිහිටි මස් කඩය—හරක්මස් සහ එළුමස්. |
| 5. ඇම. ඇම්. යාසිම්, ඉහළ කොට්ටරාමුල්ල, ලුණුවිල ... | ඉහළ කොට්ටරාමුල්ලේ ආනා සාලියම්මා මහත්මියට අයිති ඉහළ කොට්ටරාමුල්ලේ පිහිටි කැටකාලගහවත්ත — හරක්මස් සහ එළුමස්. |
| 6. ඒ. ඇම්. තාහිර්, වලහපිටිය පාර, නාත්තන්ඩිය ... | නාත්තන්ඩියේ ප්‍රන්සිස් ප්‍රනාන්දු මහත්මයාට අයිති නාත්තන්ඩිය නගරයේ පිහිටි තක්සේරු අංක 40 දරණ ඉඩම—හරක්මස් සහ එළුමස්. |

ඇස්. මොහමඩ් සාලි,
සභාපති.

1958 දෙසැම්බර් 1 වැනි දින,
මැදපළාත ගම්කායයිං සභා කායයිංලයේ,
නාත්තන්ඩිය.

## නුවරඑළිය කඩවත් සතර ගම්කායසී සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම සඳහා 1959යේ වර්‍ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය කඩවත් සතර ගම්කායසී සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඬ වන්නේ අසවල් කරුන නිසැයයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුලත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 තේ අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනතේ ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇස්. ඇම්. සරිප් ... | අංක 60, නානුඔය | හරක් මස් |
| 2. ඒ. මොහමඩ් ... | අංක 12, කඳපොළ | හරක් මස් |
| 3. සීමාසහිත ඩන්ප්‍රඩ් සමාගම ... | බ්ලැක්පූල්, මිපිළිමාන | ඌරු මස් පැක්ටෙරියක් |
| 4. පී. වයි. වේදමුත්තු නාඩාර් ... | අංක 56, නානුඔය | එළුමස් |

එච්. පී. ඇස්. නානායක්කාර,
නුවරඑළිය කඩවත් සතර ගම්කායසී සභාපති තැන.

ගම්කායසී සභා කායසීලය,
නානුඔය. 1958. 12. 2.

---

## විශෙෂ නිවේදනයයි

1958 දෙසැම්බර් 25 වැනි බ්‍රහස්පත්න්‍ද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 දෙසැම්බර් 26 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දන්වීම් සහ නිවේදන, 1958 දෙසැම්බර් 22 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 දෙසැම්බර් 6 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.